වලිකාමම් නිරිත ප්‍රාදේශිය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------------------------

1. මුල්‍ය ප්‍රකාශ
---------------

1.1 මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.
------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වු මුල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 25 දින විගණනයට ඉදිරිපත් කර තිබු අතර ඉකුත් වර්ෂය සඳහා වු මුල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වු විගණකාධිපති වාර්තාව 2014 නොවැම්බර් 26 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය
-------

මෙම වාර්තවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මුල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට වලිකාමම් නිරිත ප්‍රාදේශිය සභාවේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වු මතය වේ.

1.3 මුල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්විම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌනතා
----------------------

මුල්‍ය ප්‍රකාශන වල නිරික්ෂණය වූ ඌනතා ආදායම්, වත්කම් හා බැරකම් වශයෙන් පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මුල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම් | ආදායම් | | වත්කම් | | බැරකම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු.000 | | රු.000 | | රු.000 |
| අඩුවෙන් දැක්විම් | | | 01 | 41,182,591 | 02 | 281,335 |
| වැඩියෙන් දැක්විම් | 02 | 1,574,197 | 01 | 162,532 | 01 | 17,817 |
| අත්හැරිම් | | | | | 02 | 4,747,834 |

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

ප්‍රධාන ලෙජරයට අනුව මිශ්‍ර තැන්පතු වල ශේෂය රු.2,446,768 ක්ව පැවතියත් එය මිශ්‍ර තැන්පතු ගිණුම් වලට අනුව එය රු.2,436,568 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

-------------------------------------

විගණනය සඳහා තොරතුරු ලබා නොදීම

-----------------------------------------

විගණනයට අවශ්‍ය තොරතුරු ලබා නොදිම නිසා රු.22,960,738 ක් සඳහා වූ ගණුදෙණු හතරක් විගණනයේදි සන්නිරික්ෂණය කළ නොහැකි විය.

1.3.4 අක්‍රිය සංචිත

--------------

ඉකුත් වර්ෂ වලට අදාලව ආදායම් හා වියදම් ගිණුම් වල දැක්වුණ සංචිත අපේක්ෂිත කටයුතු සඳහා යොදා ගැනීමෙන් තොරව දිගින් දිගටම ගිණුම් වල දැක්විණි.

| සංචිත වර්ගය | 2012 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| ණය මුදල් වලින් නිදහස් විම | 92,578 | 92,578 |
| විශ්‍රාම සංචිතය | 4,570,689 | 4,570,689 |
| ඌණ පූරන සංචිතය | 3,091,296 | 3,091,296 |

1.3.5 අනුකූල නොවිම්

-------------------

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවිම් විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවිම |
|---|---|---|
| 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | |
| පරිච්ඡේදය V වගන්තිය 140 | - | නියමිත දිනට අත්තිකාරම් ගෙවිම සඳහා ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| අංක 571 | - | අවුරුදු දෙකකට අධික කල් ඉකුත් වූ තැන්පතු රු.1,671,148 ක් , 1999 වසරේ පටන් දිගින් දිගටම ගිණුම් වල පවත්වාගෙන එමින් තිබුණි. |

| | | |
|---|---|---|
| දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ 2012 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | - | ඉකුත් වර්ෂ වලදී සභාව විසින් අයකර ගත් රු.502,444 ක් වූ එකතු කළ අගය මත වූ බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණි. |
| 2006 අංක 10 දරන දේශිය ආදායම් බදු පනත | - | ඉකුත් වර්ෂය තුලදී අයකරගත් රු.57,728 ක් වූ රඳවාගැනිමේ බදු, දේශිය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රේෂණය කිරිමෙන් තොරව ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි. |
| 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බද්ද | - | ඉකුත් වර්ෂය තුලදී අයකරගත් රු.1,670,178 ක් වූ භාණ්ඩ හා සේවා බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරිමෙන් තොරව ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ වලට අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.37,893 ක් වූ අතර ඊට අනුරූපි ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,416,902 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

අයවැය විධිමත්ව පිළියෙල කර නොතිබුණි. එම නිසා අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.3,025,928 ක වෙනසක් ද අයවැයගත වියදම සහ තත්‍ය වියදම අතර රු.9,064,323 ක වෙනසක් ද විගණනයේදී නිරික්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,768 | 1,512 | 3,887 |
| බදු කුලී | 6,863 | 6,310 | - |
| බලපත්‍ර ගාස්තු | 8,013 | 3,203 | - |
| වෙනත් ආදායම් | 60,143 | 62,736 | 42,997 |

2.3.2 ආදායම් නැතිවීම

(i.) 2012 හා 2013 වර්ෂ තුලදී කෝවිල් සහ ආදිශිෂ්‍යා සමිති විසින් පවත්වන ලද ලොතරැයි වලින් රු.17,200 ක් වු විනෝද බදු අයකරගෙන නොතිබුණි.

(ii.) ශාන්ත කැනිරියා විද්‍යාලීය (ඉලවලායි) ආදි ශිෂ්‍ය සංවර්ධන සමිතිය විසින් පවත්වන ලද ලොතරැයිය මගින් එකතු කළ රු.50,000 ක මුදල සභාව විසින් විනෝද බද්දෙන් නිදහස් කිරිම නිසා එකී ආදායම් සභාවට අහිමි වි තිබුණි.

2.3.3 ආදායම් එකතු කිරිම

රු.4,134,005 ක් වු හිඟ වරිපනම් බදු සහ බදු කුලි අයකර ගැනිම සඳහා සමාලෝචිත වර්ෂය තුල දි සභාව විසින් නෛතික හෝ වෙනත් ඵලදායි ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි.

2.3.4 උසාවි දඩ මුදල්

සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජුලි කාල පරිච්ඡේදය තුල නොයකුත් ආඥාපනත් යටතේ මාලක්කම් මහෙස්ත්‍රාත් උසාවිය විසින් අයකරන ලද රු.1,684,346 ක් වු දඩ මුදල් ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. එනමුත් අගොස්තු සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය ලැබිය යුතු රු.1,233,438 ක් වු දඩ මුදල් ලැබිය යුතු ආදායම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

2.3.5 මුද්දර ගාස්තු

රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් 2006-2013 කාල පරිච්ඡේදය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තුව රු.8,363,432 ක් විය. එනමුත් මුල්‍ය ප්‍රකාශ වල ලැබිය යුතු මුදල් වශයෙන් දක්වා තිබු මුදල රු.42,750,240 ක් විය. මුද්දර ගාස්තු අයකර ගැනිම සඳහා ඵලදායි ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය
-----------------------------

2.4.1 අක්‍රිය සහ ඌන උපයෝජිත භෞතික සම්පත්
-----------------------------------------------

(අ) 2001 වර්ෂය තුලදි රු.34,342 කට සමාගම විසින් මිලදි ගත් අයිතම 24 ක් අක්‍රියව ගබඩාවේ පැවතිණි.

(ආ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ප්‍රධාන කාර්යාලයේ සහ උපකාර්යාලයේ ගඩබා වල භාවිතයට ගත නොහැකි අයිතම 67 ක් විය.

(ඇ) සමීක්ෂණ මණ්ඩලය විසින් අයිතම 35 ක් භාවිතයට ගතනොහැකි බැවින් ඒවා විනාශ කිරිමට නිර්දේශ කර තිබුණි. එනමුත් ඒවා ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඈ) සභාවේ ස්ථාවර වත්කම් ලැයිස්තුවේ දැක්වුණු අංක 252-6955 දරන පික්අප් රථය භෞතික සමීක්ෂණය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.4.2 වාහන උපයෝජනය
---------------------

(i.) අංක NPRV-9792 දරන හානියට පත් සීසෑම් යන්ත්‍රය භාවිතයෙන් තොරව වසර දෙකක පමණ කාලයක් තිස්සේ භාවිතයෙන් තොරව සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ii.) වාහන 6 ක සැතපුම් මාපක හානියට පත්ව තිබූ බැවින් කිලෝමීටරයකට ඉන්ධන පරිභෝජනය විගණනයේදි නිශ්චය කළ නොහැකි විය.

2.4.3 අයවිය යුතු කාර්ය මණ්ඩල ණය
----------------------------------

විශ්‍රාම ගිය/සේවය අත්හිටුවනු ලැබු නිලධාරින් 11 දෙනෙකුගෙන් ලැබිය යුතු හිඟ ණය ප්‍රමාණය රු.66,806 ක් විය. වසර 5 ක් ගතව ඇතත් මෙම හිඟ මුදල් අදාල ඇපකර හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනිමට කටයුතු කිරිමෙන් තොරව ලැබිය යුතු මුදල් වශයෙන් දිගින් දිගටම පෙන්නුම් කර තිබුණි.

2.4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

(i.) 2009-2010 කාල පරිච්ඡේදය තුලදි පළාත් පාලන කොමසාරිස් සහ රාජ්‍ය නොවන සංවිධාන වලින් ලද පරිත්‍යාග ප්‍රමාණය රු.151,715 ක් විය. මෙම මුදල් අපේක්ෂිත කටයුතු සඳහා නොයෙදු විවිධ ණයගැති ගිණුමේ ඇතුලත් කර තිබුණි. මේ හේතුවෙන් ජනතාවට මෙම පරිත්‍යාග මගින් ප්‍රතිලාභ ලැබී නොතිබුණි.

(ii.) වැසිකිලි ඉදි කිරිම සඳහා සමාලෝචිත වර්ෂය තුලදි යුනිසෙෆ් ආයතනය විසින් රු.160,000 මුදලක් ප්‍රදානය කර තිබුණි. මෙය භාවිතයෙන් තොරව දිගින් දිගටම මිශ්‍ර තැන්පතු ගිණුමෙහි රඳවා තිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

------------------------------------------

2012 වර්ෂයේ පටන්ම රු.42,649,820 ක මුදලක් විවිධ ණයගැති ගිණුමේ තිබූ අතර යෝජිත ව්‍යාපෘති මෙම වාර්තාවේ දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අත්හැර දැමූ ව්‍යාපෘති

----------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් අනුමත වටිනාකම රු.8,414,655 ක් වූ ව්‍යාපෘති 12 ක් අවිධිමත් ලෙස ව්‍යාපෘති සැකසීම හේතුකොට ගෙන අත්හැර දමා තිබුණි. මේ අතර වාරයේ රු.3,171,731 ක මුදලක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබූ බැවින් මෙම ව්‍යාපෘති වලින් ජනතාවට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වී තිබුණි.

3. පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) අයවැය
(ආ) විවිධ තැන්පතු
(ඇ) මිශ්‍ර තැන්පතු
(ඈ) පරිත්‍යාග
(ඉ) ස්ථාවර වත්කම්
(ඊ) කාර්ය මණ්ඩල ණය
(උ) ආදායම් එකතු කිරීම.